විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව
ஓய்வூதியத் திணைக்களம்
DEPARTMENT OF PENSIONS
ශ්‍රී ලංකා විශ්‍රාම
இலங்கை ஓய்வூதியம்
Sri Lanka Pensions

පරපුරක අභිමානය
தலைமுறையொன்றின் பெருமிதம்
Pride of a Generation

මගේ අංකය / எனது இல. / My No. Pen/Pol/06/27-2025
ඔබේ අංකය / உமது இல. / Your No. ..................
දිනය / திகதி / Date 2025.12. 19

**විශ්‍රාම වැටුප් උපදෙස් ලිපි : 08/2025**

සියලුම දිස්ත්‍රික් ලේකම්වරුන්

සියලුම ප්‍රාදේශීය ලේකම්වරුන්

**විශ්‍රාමික ජීවිත සහතිකය - 2026**

ශ්‍රී ලාංකික විශ්‍රාමික ප්‍රජාවගේ විශ්‍රාම වැටුප් ලබා දීම අඛණ්ඩව සිදු කිරීම සඳහා 2026 වර්ෂයට අදාළව ජීවිත සහතික ලබා ගැනීම පහතින් සඳහන් කර ඇති පරිදි සිදු කිරීමට අපේක්ෂිත ය.

02. (අ) **ඇඟිලි සලකුණ මගින් ජීවිත සහතික ලබා දීම.**

i. 2016.01.01 දිනට පසු විශ්‍රාම ගොස් ඇති සහ ඇඟිලි සලකුණ මගින් ජීවිත සහතිකය තහවුරු කිරීම සඳහා ලියාපදිංචි වී ඇති සියලුම විශ්‍රාමිකයින් ඒ අනුව ජීවිත සහතික ලබා දීමට කටයුතු කළ යුතු අතර ඇඟිලි සලකුණ මගින් ජීවිත සහතිකය යාවත්කාලීන කිරීමට ලියාපදිංචි වී ඇති ද යන්න පරීක්ෂා කිරීම සඳහා විශ්‍රාමිකයා විසින් අනුගමනය කළ යුතු ක්‍රමවේදය පහත පරිදි වේ.

> www.pensions.gov.lk යන විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තු නිල වෙබ් අඩවියෙහි මුල් වෙබ් පිටුවේ ඇතුළත් "විශ්‍රාමිකයින්" යන කොටසට ප්‍රවේශ වීම
>
> ↓
>
> එහි දකුණු පස ජාතික හැඳුනුම්පත් අංකය ඇතුළත් කිරීමට ඇති ස්ථානයේ තම ජාතික හැඳුනුම්පත් අංකය ඇතුළත් කිරීම
>
> ↓
>
> විශ්‍රාමිකයාගේ ජංගම දුරකතනය වෙත යොමු කරනු ලබන ඉලක්කම් හතරකින් යුත් කේතය ඇතුළත් කර තමන්ටම අනන්‍ය වූ වෙබ් පිටුව වෙත පිවිසීම
>
> ↓
>
> "ජීවිත සහතික" යන කොටසට ප්‍රවේශ වී විශ්‍රාමිකයාගේ ජීවිත සහතික යාවත්කාලීන කිරීම පිළිබඳ තොරතුරු ලබා ගැනීම



මාළිගාවත්ත, කොළඹ 10. மாளிகாவத்தை கொழும்பு 10. Maligawatta, Colombo 10.
Hot line: 1970, Direct line: 2121961, Fax: 2342078, Email: inquiries.pms@pensions.gov.lk, Web: www.pensions.gov.lk

ii. ඇඟිලි සලකුණු මගින් ජීවිත සහතිකය තහවුරු කිරීමේ පහසුකම ප්‍රාදේශීය ලේකම් කාර්යාල 26ක් හා රාජ්‍ය බැංකු හා පෞද්ගලික බැංකු 06ක ශාඛා 476ක් හරහා ක්‍රියාත්මක වේ. එම ස්ථානයන් හි නාම ලේඛනය භාෂාත්‍රයෙන් පහත පරිදි බාගත කරගත හැකි ය.

www.pensions.gov.lk → Downloads → Letters → Administrative Letters

iii. ප්‍රාදේශීය ලේකම් කාර්යාලයන්හි විශ්‍රාම වැටුප් විෂයභාර නිලධාරීන් විසින් ජීවිත සහතිකය ලබා දීමට පැමිණෙන විශ්‍රාමිකයින් වෙත එම පහසුකම් සැලසීම සඳහා ප්‍රමුඛතාවය ලබා දිය යුතු ය.

iv. ජීවිත සහතිකය ඇඟිලි සලකුණු මගින් තහවුරු කිරීම සඳහා ලියාපදිංචි වී ඇති විශ්‍රාමිකයින් ග්‍රාම නිලධාරි වෙත පැමිණියහොත් ඇඟිලි සලකුණු මගින් ජීවිත සහතිකය තහවුරු කළ හැකි බැංකු ශාඛාවක් හෝ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක් වෙත යොමු කරන ලෙසට ග්‍රාම නිලධාරීන් දැනුවත් කළ යුතු ය. එසේ වුවද, ඉහත පරිදි ලියාපදිංචි වී ඇති විශ්‍රාමිකයකුට ඇඟිලි සලකුණු ලබාදීමේ යම් අපහසුතාවක් වේ නම් හෝ ඇඟිලි සලකුණු ලබා දීම සඳහා බැංකු ශාඛාවක් / ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක් වෙත යොමු වීමේ අපහසුතාවයක් පවතින්නේ නම් හෝ එම විශ්‍රාමිකයින්ට ඇමුණුම 01 ආකෘතිපත්‍රය අනුව ජීවිත සහතික ලබා දීමට අදාළ ග්‍රාම නිලධාරි විසින් අවශ්‍ය පහසුකම් සැලසිය යුතු ය.

**(ආ) ග්‍රාම නිලධාරි විසින් සකස් කරන ඇමුණුම 01 ආකෘති පත්‍රය අනුව ජීවිත සහතික ලබා දීම.**

i. ඉහත (02) (අ) (i) හි සඳහන් විශ්‍රාමිකයින් හැර අනෙකුත් සියලුම විශ්‍රාමිකයින් තමන් ස්ථිර පදිංචි ප්‍රදේශයේ ග්‍රාම නිලධාරි විසින් සකස් කරනු ලබන මේ සමඟ ඇති ඇමුණුම 01 ආකෘති පත්‍රය අනුව ජීවිත සහතික ලබා දීමට කටයුතු කළ යුතු ය.

ii. යම් විශ්‍රාමිකයෙකු ආබාධිතභාවය, රෝගීභාවය හෝ වෙනත් යම් පෞද්ගලික කාරණයක් හේතුවෙන් තම ස්ථිර පදිංචි ග්‍රාම නිලධාරි වසමෙන් බැහැරව වාසය කරන අවස්ථාවක දී ජීවිත සහතික ලබා දීම සම්බන්ධයෙන් අදාළ විශ්‍රාමිකයාගේ ලිඛිත ඉල්ලීමක් ලබාගෙන දැනට තාවකාලිකව පදිංචි වසමේ ග්‍රාම නිලධාරි විසින් සහතික කර ප්‍රාදේශීය ලේකම්ගේ අනු අත්සනින් විශ්‍රාම වැටුප් ලිපිගොනු පවතින ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත යොමු කිරීමට කටයුතු කළ යුතු ය. එවැනි ලිඛිත තහවුරුවක් විශ්‍රාම වැටුප් ලිපිගොනු පවතින ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත ලැබුණු පසු විශ්‍රාම වැටුප් නිලධාරීන් විසින් විශ්‍රාමිකයාගේ ජීවිත සහතික යාවත්කාලීන කළ යුතු ය.

iii. පූජ්‍ය පක්ෂයට අදාළව අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශ ලේකම්ගේ අංක HAF-2/15 CORDI/1507-(SUB 1) හා 2019.11.06 දිනැති ලිපියේ සඳහන් පරිදි ග්‍රාම නිලධාරි විසින් භික්ෂූන් වහන්සේ හෝ

සිල් මාතාව වැඩ වසන විහාරය / ආරාමය / ආරණ්‍යය වෙත ගොස් ජීවිත සහතිකය ලබා ගැනීමට කටයුතු කළ යුතු ය.

iv. ආබාධිත හෝ වයස්ගතභාවය හේතුවෙන් නිවසෙහිම වෙසෙන / වැඩිහිටි නිවාසවල වෙසෙන විශ්‍රාමිකයින්ගේ හා අනත්දරුවන්ගේ ජීවිත සහතිකය එම නිවසට ගොස් පරීක්ෂා කර තහවුරු කළ යුතු ය.

**(ඇ) භාරකරුවකු පත් කර ඇති අවස්ථාවක දී ග්‍රාම නිලධාරි විසින් සකස් කරන ඇමුණුම 02 ආකෘති පත්‍රය අනුව ජීවිත සහතික ලබා දීම.**

i. ආබාධිත දරුවකු, බාල වයස්කාර අනත්දරුවකු හෝ අනෙකුත් විශ්‍රාමිකයින් වෙනුවෙන් භාරකරුවෙකු පත්කර ඇති අවස්ථාවක දී විශ්‍රාම වැටුප් කළමනාකරණ දත්ත පද්ධතියේ බොහෝවිට ඇතුළත් කර ඇත්තේ එම භාරකරුගේ නමයි. එබැවින් ජීවිත සහතිකය යාවත්කාලීන කිරීමේ දී ඇමුණුම 01 ආකෘතිය අත්සන් කිරීම භාරකරු විසින් සිදුකර ඒ අනුව දත්ත පද්ධතිය යාවත්කාලීන කරන බව පසුගිය වර්ෂවල දී නිරීක්ෂණය වී ඇත. එසේවුවවත් ජීවිත සහතිකය යාවත්කාලීන කිරීමේ අරමුණ වන්නේ ආබාධිත, අනත්දරු හෝ අනෙකුත් විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ ලබාගන්නා විශ්‍රාමිකයා ජීවත්ව සිටින බව තහවුරු කර ගැනීමයි. ඒ අනුව ඉහත නිරීක්ෂිත තත්ත්වය වළක්වා ගැනීම සඳහා භාරකරුවන් පත් කර ඇති අවස්ථාවල දී, එම භාරකරු හා අදාළ ආබාධිත දරුවා / බාල වයස්කාර අනත්දරුවා / විශ්‍රාමිකයා විසින් ඇමුණුම 02 හි ඇතුළත් ආකෘතිය අනුව ජීවිත සහතික ලබා දීමට කටයුතු කළ යුතු ය.

ii. විශ්‍රාම වැටුපක් ලබා ගන්නා විශ්‍රාමිකයකු වෙනත් විශ්‍රාමිකයෙකු වෙනුවෙන් භාරකරුවෙකු ලෙස පත්කර ඇති විට එවන් අයකු විසින් තමන් ලබා ගන්නා විශ්‍රාම වැටුපට අදාළව ඇමුණුම 01 ආකෘති පත්‍රය අනුව හෝ ඇඟිලි සලකුණ මගින් ජීවිත සහතිකය ලබාදිය යුතු අතර භාරකරුවකු ලෙස කටයුතු කිරීමට අදාළව ඇමුණුම 02 ආකෘති පත්‍රයෙහි අවශ්‍ය තොරතුරු සඳහන් කිරීම සිදු කළ යුතු ය.

**(ඈ) මියගිය ත්‍රිවිධ හමුදා සහ පොලිසියේ සාමාජිකයින් වෙනුවෙන් මාසිකව ස්ථාවර දීමනාව ලබා ගන්නා දෙමව්පියන් වෙතින් ජීවිත සහතික ලබා ගැනීම**

i. යුධමය වාතාවරණය පැවති වකවානුවේ ක්‍රියාන්විත ප්‍රදේශවල සහ ක්‍රියාන්විත ප්‍රදේශ ලෙස නම් නොකරන ලද ප්‍රදේශවල රාජකාරියේ යෙදී සිටිය දී සෘජුවම ත්‍රස්තක්‍රියා හේතුවෙන් 2009.05.19 දිනට පෙර මියගිය ත්‍රිවිධ හමුදාවේ සහ ශ්‍රී ලංකා පොලිසියේ විවාහක සහ අවිවාහක සාමාජිකයින්ගේ දෙමව්පියන් ජීවත්ව සිටී නම් මියගිය සාමාජිකයා වයස අවුරුදු 55ට එළඹෙන දින සිට එම දෙමව්පියන් ජීවත්ව සිටින තෙක් ඔවුනට රු.25,000/-ක ස්ථාවර මාසික දීමනාවක් ගෙවීමට 2021.05.18 දිනැතිව

නිකුත් කර ඇති ආරක්ෂක අමාත්‍යාංශ චක්‍රලේඛ අංක MOD/01/2021 මගින් ප්‍රතිපාදන සලසා ඇත.

ii. ඉහත (ඇ) (i) හි සඳහන් ප්‍රතිලාභීන්ගේ මියයෑම් මෙම දෙපාර්තමේන්තුව වෙත නිසිපරිදි වාර්තා නොවීම මත ස්ථාවර දීමනා ගෙවීමේ දී වැඩිපුර ගෙවීම් සිදුවන බවට නිරන්තරයෙන් තොරතුරු වාර්තාවන බව නිරීක්ෂණය වී ඇත. එබැවින් මෙම ප්‍රතිලාභීන් වෙතින් ද 2026 වර්ෂයේ සිට ජීවිත සහතික ලබා ගැනීමට තීරණය කර ඇත.

iii. ඒ අනුව මේ වන විට මාසික ස්ථාවර දීමනාව හිමිගන්වන මියගිය ත්‍රිවිධ හමුදා සහ පොලිසියේ සාමාජිකයන්ගේ දෙමව්පියන්ගේ නාම ලේඛනය Life Certificate මොඩියුලය යටතේ වෙනම උප මෙනුවකට (Sub Menu) ඇතුළත් කර ඔබ වෙත යොමු කිරීමට කටයුතු කරනු ලැබේ.

iv. ඉහත (ඇ) (iii) ලේඛනයේ නම් සඳහන් මාසික ස්ථාවර දීමනාව ලබාගන්නා ප්‍රතිලාභීන් ජීවිත සහතිකය ලබා දීමට පැමිණි විට ස්ථාවර දීමනා ප්‍රදාන පත්‍රයේ පිටපතක් ඔවුන් වෙතින් ලබා ගෙන ඇමුණුම 03 ආකෘති පත්‍රය අනුව ජීවිත සහතිකය ලබා ගැනීමට කටයුතු කළ යුතු ය. සම්පූර්ණ කරන ලද එම ආකෘති පත්‍රය ග්‍රාම නිලධාරි සහ ප්‍රාදේශීය ලේකම් විසින් අත්සන් කර ගණකාධිකාරි (සැපයුම් හා ස්ථාවර දීමනා ගෙවීම්), විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව, මාලිගාවත්ත, කොළඹ 10 ලිපිනය වෙත ලියාපදිංචි තැපැල මගින් 2025.04.05 දිනට පෙර යොමු කළ යුතු ය.

v. මාසික ස්ථාවර දීමනාව හිමිගන්වන මියගිය ත්‍රිවිධ හමුදා සහ පොලිසියේ සාමාජිකයින්ගේ දෙමව්පියන්, යැපෙන්නන්ගේ දීමනාව ද ලබා ගන්නා අවස්ථාවල දී එවැනි අයකු යැපෙන්නන්ගේ දීමනාව ලබා ගැනීම වෙනුවෙන් (02) (අ) හෝ (02) (ආ) යන ක්‍රමයක් අනුව ජීවිත සහතිකය ලබා දීම සිදු කළ යුතු අතර ස්ථාවර මාසික දීමනාව ලබාගැනීමට අදාළව (02) (ඇ) අනුව ජීවිත සහතිකය ලබා දීම සිදු කළ යුතු ය.

03. ජීවිත සහතික දත්ත පද්ධතිය 2026.03.31 දිනට පෙර යාවත්කාලීන කළ යුතු බැවින් එය ගැටළුවකින් තොරව සිදු කිරීම සඳහා පහත පරිදි කටයුතු කළ යුතු ය.

i. 2026 වර්ෂය සඳහා ජීවිත සහතික යාවත්කාලීන කිරීම සිදුකළ යුත්තේ 2026.01.01 දිනට හෝ එදිනට පසු දිනයකදී ය. එබැවින් 2026.01.01 දිනට පෙර ග්‍රාම නිලධාරි වෙත ගොස් හෝ ඇඟිලි සලකුණු මගින් ජීවිත සහතික යාවත්කාලීන කිරීම සිදු නොකළ යුතු ය.

ii. ඇමුණුම 01 ආකෘතිය විශ්‍රාමිකයින් විසින් අත්සන් කිරීමෙන් පසුව ග්‍රාම නිලධාරි විසින් සහතික කර 2026.02.16 දිනට ප්‍රාදේශීය ලේකම් වෙත භාරදිය යුතු ය. එම තොරතුරු මත විශ්‍රාම වැටුප් විෂයභාර නිලධාරීන් විසින් දත්ත පද්ධතිය යාවත්කාලීන කිරීමෙන් අනතුරුව එතෙක් ජීවිත සහතිකය තහවුරු කිරීම සඳහා අත්සන් නොකළ විශ්‍රාමිකයන්ගේ ලේඛනය

2026.02.20 දින නැවත අදාළ ග්‍රාම නිලධාරි වෙත ලබාදිය යුතු ය. ග්‍රාම නිලධාරි විසින් එම ලේඛනය ද සම්පූර්ණ කර 2026.03.31 දිනට ප්‍රාදේශීය ලේකම් වෙත භාර දී අවසන් කරනු ඇතැයි අපේක්ෂා කෙරේ.

iii. ඉහත සෑම අවස්ථාවකදී ම ග්‍රාම නිලධාරි වෙත ඉදිරිපත්ව අත්සන් කිරීමට අපොහොසත් වූ විශ්‍රාමිකයන්ගේ අත්සන තීරුව නැවත අත්සන් කළ නොහැකි සේ කපා හැරීමට වගබලාගත යුතු ය.

iv. ජීවිත සහතිකය 2026.03.31 දිනට යාවත්කාලීන නොකරන විශ්‍රාමිකයන්ගේ විශ්‍රාම වැටුප සහ ඉහත (02) (ඇ) හි සඳහන් ස්ථාවර දීමනා ලාභීන්ගේ මාසික ස්ථාවර දීමනාව 2026 අප්‍රේල් මස සිට අත්හිටුවන බවට විශ්‍රාමිකයින්ට සහ එම මාසික ස්ථාවර දීමනා ලාභීන්ට දැනුම් දිය යුතු ය.


**චාමින්ද හෙට්ටිආරච්චි**

විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්

දුරකථනය : 011 2 421786

ෆැක්ස් : 011 2 431413

විද්‍යුත් ලිපිනය : pen7policydep@gmail.com


**පිටපත** - ලේකම්, රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය - කරු. දැ.ගැ.ස.

ඇමුණුම 01

Sri Lanka Pensions

## විශ්‍රාම වැටුප් උපදෙස් ලිපි 08/2025 සමඟ නිකුත් කරන ලද ආකෘතිය

## ජීවිත සහතික යාවත්කාලීන කිරීම - 2026

| දිස්ත්‍රික්කය | | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | | ග්‍රාම නිලධාරි වසමේ නම හා අංකය | |
|---|---|---|---|---|---|

| 01. විශ්‍රාමිකයාගේ නම | 02. විශ්‍රාම වැටුප් අංකය (වර්ගය/අංකය) | 03. ජාතික හැඳුනුම්පත් අංකය | 04. දුරකථන අංකය | 05. අත්සන | 06. වෙනත් |
|---|---|---|---|---|---|
| 1. | | | | | |
| 2. | | | | | |
| 3. | | | | | |
| 4. | | | | | |
| 5. | | | | | |
| 6. | | | | | |
| 7. | | | | | |
| 8. | | | | | |
| 9. | | | | | |
| 10. | | | | | |
| 11. | | | | | |
| 12. | | | | | |
| 13. | | | | | |
| 14. | | | | | |
| 15. | | | | | |

ඉහත අත්සන් කර ඇති විශ්‍රාමිකයන් මා ඉදිරියේ සිය අත්සන් සටහන් කළ බව සහතික කරමි.

................................
දිනය

................................................................................
ග්‍රාම නිලධාරිගේ අත්සන හා නිලමුද්‍රාව

ඇමුණුම 02

ශ්‍රී ලංකා විශ්‍රාම
இலங்கை ஓய்வூ
Sri Lanka Pension

මෙය නොමිලයේ නිකුත් කරනු ලබන ආකෘතියකි.

# විශ්‍රාමික ජීවිත සහතිකය - 2026

විශ්‍රාම වැටුප් ගෙවීමට අදාළ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය

අනු අංකය
(ග්‍රාම නිලධාරි
වෙත අංක
කිරීම සඳහා)

**සැ.යු. : භාරකරුවන් පත් කර ඇති අවස්ථාවල දී අදාළ ආබාධිත දරුවා / බාල වයස්කාර අනත්දරුවා / විශ්‍රාමිකයා මෙම ආකෘතිය අනුව 2026.03.31 දිනට පෙර ජීවිත සහතික ලබා දීමට කටයුතු කළ යුතු ය.**

1. විශ්‍රාම වැටුප් ලබන්නා පිළිබඳ තොරතුරු

   1.1. මුලකුරු සමඟ නම (විශ්‍රාම වැටුප් ලබන්නා ආබාධිත දරුවෙකු / ආබාධිත විශ්‍රාමිකයෙකු / බාලවයස්කාර අනත්දරුවෙකු / විශ්‍රාම වැටුප් ලබන වෙනත් විශ්‍රාමිකයෙකු විය හැකිය) : ..........................................

   .................................................................................................... ...........................................

   1.2. ජාතික හැඳුනුම්පත් අංකය (අනිවාර්ය වේ) : ................................................................

   1.3. උපන් දිනය (වර්ෂය/මාසය/දිනය) : ................................................................

   1.4. විශ්‍රාම වැටුප් අංකය : ................................................................

   1.5. පදිංචි ලිපිනය : ................................................................

   1.6. දුරකතන අංක - නිවස : ................................................................

   ජංගම : ................................................................

   1.7. ග්‍රාම නිලධාරි වසම හා අංකය : ................................................................

2. භාරකරුවෙකු සිටී නම්,

   2.1. ඔහුගේ / ඇයගේ නම : ................................................................

   2.2. ඔහුගේ / ඇයගේ ජා.හැ. අංකය : ................................................................

   2.3. ඔහුගේ / ඇයගේ දු.ක. අංකය - නිවස : ................................................................

   ජංගම : ................................................................

**ඉහත සඳහන් කරන ලද කරුණු සත්‍ය බවට ප්‍රකාශ කරමි.**

දිනය : ......................... ........................................ ........................................

විශ්‍රාමිකයාගේ අත්සන | භාරකරුගේ අත්සන

**ග්‍රාම නිලධාරි වාර්තාව**

ඉහත විශ්‍රාමික ස්වාමීන් වහන්සේ / පූජකතුමා / මහතා / මහත්මිය / මෙනෙවිය මෙම ග්‍රාම නිලධාරි වසමේ අදාළ ලිපිනයෙහි ස්ථිර / තාවකාලික පදිංචිකරුවකු බව සහතික කරමි. උන්වහන්සේ / ඔහු / ඇය තනිව කටයුතු කර ගැනීමට හැකි යහපත් සෞඛ්‍ය තත්ත්වයක ඇත. / නැත. මෙම නම ඡන්ද හිමි නාම ලේඛනයේ සඳහන්ව ඇත. / නැත.

දිනය : ................................ ..................................................

ග්‍රාම නිලධාරි අත්සන හා නිල මුද්‍රාව

ඇමුණුම 03

ශ්‍රී ලංකා විශ්‍රාම
இலங்கை ஓய்வூதிய
Sri Lanka Pensions

විශ්‍රාම වැටුප් උපදෙස් ලිපි 08/2025 සමඟ නිකුත් කරන ලද ආකෘතිය

මියගිය ත්‍රිවිධ හමුදා සහ පොලිසියේ සාමාජිකයා වෙනුවෙන් මාසිකව ස්ථාවර දීමනාව ලබා ගන්නා දෙමව්පියන්

වෙතින් ජීවිත සහතික ලබා ගැනීම - 2026

| දිස්ත්‍රික්කය | | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | | ග්‍රාම නිලධාරී වසමේ නම හා අංකය | |
|---|---|---|---|---|---|

| 01. මාසික ස්ථාවර දීමනා ලාභියාගේ නම | 02. මියගිය ත්‍රිවිධ හමුදා සහ පොලිසියේ සාමාජිකයාගේ ජාතික හැඳුනුම්පත් අංකය / සෙබල අංකය | 03. මාසික ස්ථාවර දීමනා ලාභියාගේ ජාතික හැඳුනුම්පත් අංකය | 04. මාසික ස්ථාවර දීමනා ලාභියාගේ දුරකථන අංකය | 05. මාසික ස්ථාවර දීමනා ලාභියාගේ අත්සන | 06. වෙනත් |
|---|---|---|---|---|---|
| 1. | | | | | |
| 2. | | | | | |
| 3. | | | | | |
| 4. | | | | | |
| 5. | | | | | |
| 6. | | | | | |
| 7. | | | | | |
| 8. | | | | | |
| 9. | | | | | |
| 10. | | | | | |

ඉහත අත්සන් කර ඇති මාසික ස්ථාවර දීමනා ලාභීන් මා ඉදිරියේ සිය අත්සන් සටහන් කළ බව සහතික කරමි.

.......................................................... ..............................

ග්‍රාම නිලධාරිගේ අත්සන හා නිලමුද්‍රාව දිනය

.......................................................... ..............................

ප්‍රාදේශීය ලේකම්ගේ අත්සන හා නිලමුද්‍රාව දිනය